## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2016

---

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතේ 10(අ)(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ස්වයං මූල්‍ය අරමුදල යටතේ දක්වා තිබුණු ගොඩනැගිලි සඳහා ක්ෂය රු.22,676,208 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ස්වයං මූල්‍ය අරමුදලේ වෙනත් ආදායම් යටතේ මුද්‍රණාල ආදායම ලෙස රු.1,187,588 ක් දක්වා තිබුණු නමුත් මුද්‍රණ අංශයේ තොරතුරු වලට අනුව එම ආදායම රු.6,010,213 ක් විය. ඒ අනුව මුද්‍රණාල ආදායම රු.4,822,625 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී වැඩ නිම කර භාවිතයට ගෙන තිබුණු රු.87,414,822 ක් වටිනා විශ්ව විද්‍යාලයෙහි වෛද්‍ය පීඨයේ වායු සමීකරණ හා වාතාශ්‍ර පද්ධතිය 2016 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය තුළ මාර්ග පද්ධතිය සහ වැට ආවරණය ඉදිකිරීම සඳහා දරා තිබුණු රු. 29,241,957 ක් වූ මුදල 2014 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ ස්පෘශ්‍ය වත්කම් වශයෙන් දක්වා තිබුණු නමුත් ඒ සඳහා ක්ෂය ගැලපීම් කර නොතිබුණි

(ඉ) 2011 වර්ෂයේදී ඉදිකර භාවිතයට ගෙන තිබුණු රු.1,163,536 ක් වටිනා ජීව වායු ඒකකයක් මූල්‍ය ප්‍රකාශනවල ස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා තිබුණු නමුත් ඒ සඳහා වාර්ෂික ක්ෂය ප්‍රතිපාදනය 2011 වර්ෂයේ සිට සිදු කර නොතිබුණි.

(ඊ) කැඩෙට් නිලධාරීන් විසින් ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු. 7,000,223 ක මුදල විශ්වවිද්‍යාල ආදායමට බැර කිරීම වෙනුවට ස්වයං පාලන අරමුදල් ගිණුමට බැර කර තිබුණු නමුත් ඊට හේතු පැහැදිලි කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්වයං මූල්‍ය අරමුදලෙහි නොපියවූ මිලදී ගැනීම් අත්තිකාරම් ලෙස 2014 වර්ෂයේ සිට අඛණ්ඩව දක්වා තිබුණු රු.2,606,394 ක ශේෂය තුළ පැවති රු. 1,454,321 ක නිරවුල් නොකළ අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම්වල ඇතුළත් වූ වටිනාකම රු.1,491,625 ක් වූ වෙනත් වත්කම් හා රු.43,803,874 ක් වූ ඉඩම් සංවර්ධන පිරිවැය, 2008 වර්ෂයේ සිට අඛණ්ඩ මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණු නමුත් ඉන් නියෝජනය වූ වත්කම් භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් නොවීය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ යටතේ ගොඩනැගිලි සහ වෙනත් වත්කම් ලෙස රු.13,847,542 ක වටිනාකමක් 2011 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුණු නමුත් ඉන් නියෝජනය වන වත්කම් භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් නොවීය.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ණය හිමි ශේෂය ලෙස රු. 1,511,181,993 ක් දක්වා තිබුණු අතර, එම වටිනාකම තුළ වර්ෂ 02 කට අධික කාලයක සිට නිරවුල් නොකර පැවති රු.14,403,186 ක ණය හිමි ශේෂ සහ වර්ෂ 02 කට වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවති රු.27,703,433 ක් වූ ගෙවිය යුතු වියදම්ද ඇතුළත්ව පැවතුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | **නීති, රීති රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 237(ආ) | මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට පෙර අදාළ භාණ්ඩ සියල්ල ලැබී ඇති බවට ද, අදාළතොග ලේඛනයන්හි එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවටද සහතික කළ යුතු වුවද, ඊට පටහැනි ලෙස 2016 වර්ෂය තුළදී අවස්ථා 670 කදී භාණ්ඩ මිලදී ගැනීමට පෙර අත්තිකාරම් වශයෙන් රු.122,803,287 ක් ගෙවා තිබුණි. ඉහත පරිදි ඉකුත් වර්ෂ 05 ක කාලය තුළදී ගෙවා තිබුණු රු.92,112,669 ක් වූ අත්තිකාරම් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. |
| **(ආ)** | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) වගන්තිය | වටිනාකම රු. 500,000 ඉක්මවන භාණ්ඩ මිලදී ගැනීම සඳහා විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹිය යුතු වුවද රු.19,712,855 ක් වටිනා කොන්ත්‍රාත්තු 04 ක් |

| | | |
|---|---|---|
| | | සම්බන්ධයෙන් විධිමත් පරිදි ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. |
| (ඇ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල පනත | 2006 ජනවාරි 01 දින සිට 2011 මැයි 11 දින දක්වා වූ කාලය තුළ විශ්වවිද්‍යාලය විසින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.8,210,785 ක් වූ දායකය 2016 දෙසැම්බර් 31 දින වන වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------------

විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගෙන තිබුණු ණය මුදල වෙනුවෙන් පොළිය ගෙවීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.4,554,308,836 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් නිදහස් කර තිබුණු අතර, ඉන් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.4,486,387,102 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ඉකුත් වර්ෂ 02 ක කාල සීමාව තුළ ලැබී තිබුණු එකතුව රු.67,921,734 ක්වූ අමතර ප්‍රතිපාදනය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ අනෙකුත් කටයුතු සඳහා වියදම් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.955,434,499 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.676,191,883 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.279,242,616 ක පිරිහීමක් විය. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකිරීමේ පිරිවැයෙහි වූ විනිමය අවාසිය රු.1,310,332,348 කින් සහ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් පිරිවැය රු.207,950,617 කින් ඉහළ යාම ඉහත මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 හා 2014 වර්ෂ වලදී පිළිවෙලින් රු.36,566,608 ක හා රු.250,842,194 ක අතිරික්තයක් ජනනය කර තිබුණු නමුත් 2013, 2015 හා 2016 වර්ෂ වලදී මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් උද්ගතවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු විශ්වවිද්‍යාලයේ දායකත්වය 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණු නමුත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එය රු. 168,521,705 කින් පිරිහී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

විශ්වවිද්‍යාලයේ 2016 හා 2015 වර්ෂ වල දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් වැදගත් කෙටි කාලීන හා දිගු කාලීන නුබුන්වත්භාවය පිළිබඳ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2016 | 2015 |
|---|---|---|
| | % | % |
| ස්කන්ධ ප්‍රාග්ධනයට දිගු කාලීන ණය ප්‍රාග්ධනය | 389 | 367 |

| | **2016** | **2015** |
|---|---|---|
| | (රු) | (රු) |
| ඒක ශිෂ්‍ය ආදායම | 604,536 | 747,759 |

විශ්වවිද්‍යාලය විසින් ශික්ෂන රෝහල ඉදිකිරීම සඳහා ණය ලබා ගැනීම හේතුවෙන් ඉකුත් වර්ෂයට වඩා ස්කන්ධ ප්‍රාග්ධනයට හා මුළු ප්‍රාග්ධනයට දිගු කාලීන ණය ප්‍රාග්ධන අනුපාත ඉහල ගොස් තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඒක ශිෂ්‍ය ආදායම රු.143,223 කින් හෙවත් සියයට 19.13කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්යසාධනය
--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ පිහිටුවා තිබුණු මෙම ආයතනය, 2011 වර්ෂය වනතෙක් ආරක්ෂක සේවාවන්හි සේවා නියුක්ත නිලධාරින් සඳහා ආරක්ෂක කටයුතු සම්බන්ධ උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා පමණක් සීමාවිය. 1988 අංක 27 දරන සංශෝධිත පනත සහ 2007 අංක 50 දරන සංශෝධිත පනත අනුව උක්ත ආයතනය විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කර තිබුණු නමුත් ආරක්ෂක සේවාවන්හි සේවා නියුක්ත නොවන විද්‍යාර්ථීන්ට උපාධි පිරිනැමීම සඳහා බලය පැවරීම සඳහා වූ වගන්ති උක්ත පනත් වල ඇතුළත් නොවීය. කෙසේ වෙතත් 2011 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින වනතෙක් මුදල් ගෙවීමේ පදනම මත ඇතුළත් කර ගත් විදේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් 199 දෙනෙක්ද ඇතුළුව බාහිර ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2845 දෙනෙකුට උපාධි සහතික පිරිනමා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් 3,073 දෙනෙක් අධ්‍යාපන කටයුතුවල නිරතව සිටි අතර, ඉන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1,728 දෙනෙක් ගාස්තු ගෙවීමේ පදනම මතද ඉතිරි 1,345 ක්වූ ශිෂ්‍යයින් නිදහස් ගාස්තු පදනම මත බඳවාගත් ත්‍රිවිධ හමුදාවේ සේවයේ නියුතුව සිටි කැඩෙට් නිලධාරීන් විය. සමාලෝචිත වර්ෂය තුළ දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් 829 දෙනෙක් විශ්වවිද්‍යාලය විසින් පැවැත්වූ පාඨමාලා 22 කට ඇතුළත් කරගෙන තිබුණු අතර, එය ඉකුත් වර්ෂයේ ඇතුලත් කරගෙන තිබුණු 850 ක ශිෂ්‍ය සංඛ්‍යාව සමග සැසඳීමේදී සියයට 2.47 ක අඩුවීමක් විය. විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට ගාස්තු අයකිරීමේ පදනම මත විදේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් පමණක් බඳවා ගෙන තිබුණු අතර ඉකුත් වර්ෂයේ බඳවා ගෙන තිබුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් 54 දෙනාට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් 23 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි.

(ඇ) අනාගත මූල්‍ය අවශ්‍යතා සහ වෙළඳපොළ තරඟකාරීත්වය යන අභියෝග ජය ගැනීම සඳහාත්, ප්‍රමාණවත් පරිදි ආදායම් වර්ධනය කිරීම සඳහාත්, විශ්වවිද්‍යාලය කඩිනම් පියවර ගතයුතු බව විගණනයේදී අනාවරණය විය. ඒ අනුව මුදල් පදනම මත දේශීය හා විදේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම විධිමත් විය යුතු අතර, විදේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් ආකර්ෂණය කර ගැනීම සඳහා තරඟකාරී වැඩපිළිවෙලක අවශ්‍යතාවය තවදුරටත් පවතින බවත් නිරීක්ෂණය විය. 2016 දෙසැම්බර් 31 දින වන විට භූතාන රජය සහ රුවන්ඩා රජය සමග පමණක් ඊට ගැලපෙන පරිදි අවබෝධතා ගිවිසුමකට එළඹීමට කටයුතු කර තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දින වන විට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 346 ක් දක්ෂිණ මණ්ඩපය තුළ අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන නමුත් දේශනශාලා 08 කින් සමන්විත මෙම මණ්ඩපයේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් පවතින දේශනශාලා ධාරිතාවය ප්‍රමාණවත් මට්ටමක නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. විශ්වවිද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපය විසින් පවත්වනු ලබන පරිගණක පීඨයට අයත් පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 166 දෙනෙක් ඇතුළත් කරගෙන තිබුණු නමුත් ඔවුන්ට ප්‍රමාණවත් පරිගණක අධ්‍යයන පහසුකම් සලසා නොතිබුණි. ඒ හේතුවෙන් විශ්වවිද්‍යාලයේ නිර්මිත පරිසර හා අවකාශීය විද්‍යා පීඨයට අයත් පරිගණක විද්‍යාගාරයක පරිගණක පීඨයේ ශිෂ්‍යයන් අධ්‍යාපන කටයුතු සිදු කරනු ලැබුණි. දක්ෂිණ මණ්ඩපය සඳහා ස්ථිර පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකර නොතිබීම හේතුවෙන් උපාධි අපේක්ෂකයින් සඳහා වූ පුස්තකාලය වර්ග අඩි 1152 ක පමණ විශාලත්වයකින් යුත් සෙවිලි තහඩු වලින් නිම කර තිබුණු පෙර නිමි ගොඩනැගිල්ලක පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා වේරහැර ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ ශික්ෂණ රෝහල් ශල්‍යාගාරය සඳහා රු. 26,928,000 ක් වටිනා ආලෝක පද්ධති 13 ක් පෞද්ගලික ආයතන 02 කින් 2015 අගෝස්තු 13 දින වන විට රෝහල් පරිශ්‍රය වෙත සැපයුම්කර තිබුණු නමුත් ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම හේතුවෙන් එම උපකරණ සැපයුම්කාර ආයතනය වෙත ආපසු හරවා යවා තිබුණි

තවද, රෝහල සඳහා රු.24,090,730 ක් වටිනා කැමරා සහිත ශල්‍යාගාර විද්‍යුත් ආලෝක පද්ධති 06 ක් මිලදී ගැනීම සඳහා වටිනාකමින් සියයට 80කට සමාන රු.19,272,584 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. අදාල භාණ්ඩ 2015 නොවැම්බර් 10 දින සැපයුම් කර තිබුණු නමුත් ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම මත එම ආයතනය වෙත නැවත හරවා යවා තිබුණි. ශික්ෂණ රෝහලේ කටයුතු ආරම්භ කර තිබුනේ 2017 මැයි මාසයේ වුයෙන් අවශ්‍යතාවයට පෙර භාණ්ඩ මිලදී ගෙන මාස 18 කට වැඩි කාලයක් අදාළ වත්කම් බාහිර පාර්ශවයකට අයත් පරිශ්‍රයක නිෂ්කාර්යව පැවතුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ ඇපකරයක් මත 2013 මාර්තු 28 දින එක්සත් ජනපද ඩොලර් මිලියන 177 ක විදේශ මුදලින් වූ ණයක් සහ රු. 3,165,123,000 ක දේශීය ණය මුදලක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගෙන තිබුණි. ණය ගිවිසුම අනුව, දේශීය මුදලින් ලබා ගත් ණය මුදල විශ්ව විද්‍යාලය විසින් 2032 වර්ෂය වනවිට සම්පූර්ණයෙන් ආපසු ගෙවිය යුතු විය. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් අඛණ්ඩව අලාභ ලබා තිබීමත්, මුදල් අය කිරීමේ පදනම මත බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකර ගැනීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් අනුගමනය නොකිරීම හේතුවෙන් විශ්ව විද්‍යාලය විසින් එකඟ වූ පරිදි ණය වාරික ගෙවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය වූයෙන් ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 18 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී ධාවන තත්ත්වයේ පැවති මෝටර් වාහන 08 ක මයිලෝ මීටර වර්ෂයකට වඩා වැඩි කාලයක සිට ක්‍රියා විරහිතව තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව එම වාහන සම්බන්ධව ඉදිරිපත් කර තිබුණු ධාවන සටහන් වල නිවරදිතාවය පිළිබඳව විගණනයේදී ගැටළු සහගත වූ අතර, මයිලෝ මීටර යථා තත්ත්වයට පත්කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි .

## 4.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

උසස් පර්යේෂණ හා අධ්‍යයන සමායෝජන ව්‍යාපෘතිය යටතේ වූ පොල් පෙර සැරි නිෂ්පාදන හා පර්යේෂණ කටයුතු සඳහා රු. 10,948,998 ක පිරිවැයක් දරා දක්ෂිණ මණ්ඩපය තුළ ඉදිකර තිබුණු ගොඩනැගිල්ලක් විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ ශාරීරික සුවතා මධ්‍යස්ථානයක් ලෙසට යොදාගෙන තිබුණි. ඒ හේතුවෙන් දක්ෂිණ මණ්ඩපය විසින් ඉටු කිරීමට නියමිතව තිබුණු පොල් පෙර සැරි නිෂ්පාදන හා පර්යේෂණ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.4 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර තිබුණු නමුත් ඊට භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් මූල්‍යනය කිරීමට අපේක්ෂිත ප්‍රාග්ධන වියදම් පමණක් ඇතුළත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ස්වයං මූල්‍ය අරමුදල මගින් සිදුකළ ප්‍රාග්ධන වියදම් ඊට ඇතුළත් කර නොතිබුණි.

(ආ) දක්ෂිණ මණ්ඩපයේ ජලසැපයුම් පද්ධතියක් ස්ථාපනය කිරීම සහ ජල ටැංකි මිලදී ගැනීම වෙනුවෙන් පෞද්ගලික පාර්ශවයක් වෙත 2015 මාර්තු 09 දින ලබාදී තිබුණු වටිනාකම රු.2,871,570 ක් වූ කොන්ත්‍රාත්තුවේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. මේ සඳහා ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු අතර නිදහස් කර තිබුණු සංචලන අත්තිකාරම් සඳහා කාර්ය සාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණි.

(ඇ) අක්කර 143 කින් සමන්විත දක්ෂිණ මණ්ඩපය පිහිටි භූමියෙන් අක්කර 18 ක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වූ අතර, අනෙක් අක්කර 125 ක භූමිය මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් විය. සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති ඉඩම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් වූ අතර, එම භූමිය විශ්වවිද්‍යාලයට පවරා ගැනීමේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. 2011 වර්ෂයේදී ආරම්භ කළ දක්ෂිණ මණ්ඩපයට අයත් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂයේ නිම කළ යුතු වුවත් දෙවන හා තෙවන අදියරවල කටයුතු ප්‍රමාණවත් අරමුදල් නොමැති වීමෙන් මන්දගාමීව සිදුවන බව භෞතික පරීක්ෂාවේදී හෙළිදරව් විය. දක්ෂිණ මණ්ඩපයේ ඉදිකිරීම් කටයුතු පිළිබඳව පාරිසරික නිර්දේශයන් මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉල්ලා තිබුණු නමුත් 2015 අප්‍රේල් 23 වන දින මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකරන අවස්ථාවේදී යෝජිත ඉදිකිරීම් වලින් කොටසක් අවසන් වී තිබුණු බැවින්, ඊට පාරිසරික නිර්දේශයක් ලබා දිය නොහැකි බව දන්වා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණු ත්‍රිවිධ හමුදා නිලධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අදාල ආයතනය | අනුයුක්ත වූ මාණ්ඩලික නිලධාරීන් සංඛ්‍යාව | අනුයුක්ත වූ මාණ්ඩලික නොවන නිලධාරීන් සංඛ්‍යාව | මුළු ගණන |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| ------------ | ------------------- | ------------------- | ----------- |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 72 | 456 | 528 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 30 | 351 | 381 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 15 | 122 | 137 |
| **එකතුව** | 117 | 929 | 1,046 |

අනුමත කාර්ය මණ්ඩලයට අමතරව විශ්වවිද්‍යාලයේ සේවා නියුක්ත කර සිටින හමුදා නිලධාරීන් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් අනුමැතියක් ලබා ගන්නා ලෙස රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව විසින් 2013 මාර්තු 05 දින පැවැත්වූ රැස්වීමේදී උපදෙස් ලබාදී තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) දක්ෂිණ මණ්ඩපයේ පීඨ තුනක් යටතේ පවත්වනු ලබන පාඨමාලා 05 ක් සඳහා අනුමත ආචාර්ය මණ්ඩලය 76 දෙනෙකු වුවද 33 දෙනෙකුගෙන් සමන්විත ආචාර්ය මණ්ඩලයක් පමණක් සේවයේ නියුක්ත කර තිබුණි. තවද , මෙම මණ්ඩපයේ ආචාර්යවරුන් සම්බන්ධ තොරතුරු විශ්ලේෂණය කිරීමේදී මහාචාර්ය තනතුරු 12 ක් අනුමත වී තිබුණු නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විට කිසිදු මහාචාර්යවරයෙක් බඳවා ගෙන නොතිබුණි. මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 42ක් අනුමත වී තිබුණු නමුත් 2016 දෙසැම්බර් 31 දින වනවිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 12 දෙනෙක් පමණක් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 6.5 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් විශ්වවිද්‍යාලයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනය 2017 පෙබරවාරි 28 දින වන විට විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු නමුත් විගණනයේ අනාවරනය වූ ගිණුම්කරණ අඩුපාඩු සඳහා ගැලපීම් සිදු කිරීමෙන් අනතුරුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශනය විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2017 ජුනි 29 දිනදීය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

ප්‍රවාහන වියදම්, ගිවිසුම් සේවා වියදම්, අනෙකුත් වියදම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී අයවැය ගත වියදම හා සත්‍ය වියදම අතර සියයට 10 සිට සියයට 201 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් අක්කර 47 රූඩ් 37.9 ක් වූ ඉඩමක විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහල ඉදිකර තිබුණු නමුත් 2016 දෙසැම්බර් 31 දින වනතෙක් එහි අයිතිය පවරා ගෙන නොතිබුණි.

## 5.4 කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය

1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනතට අනුව දක්වා නොතිබුණු රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ කළමනාකරණ මණ්ඩලයේ ලේකම්වරයා යන නිලධාරින් කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් ලෙස සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| | පද්ධති පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පාලනය | ලිඛිත ගිවිසුම් වලට එළඹීමෙන් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම. |
| (ආ) | මිලදී ගැනීම් පාලනය | i. රජයේ මූල්‍ය රෙගුලාසි හා ප්‍රසම්පාදන මහ පෙන්වීම් වලට පරිබාහිරව භාණ්ඩ මිලදී ගැනීම.<br>ii. භාණ්ඩ ලැබීමට පෙර අත්තිකාරම් ගෙවීම. |